# සත්තරසමො පාඨො | ඉත්ථිසද්දො පුරිසස්ස චිත්තං ආකඩ්ඪති

සාමණෙරො අරඤ්ඤෙ දාරූනි උද්ධරන්තියා එකිස්සා ඉත්ථියා ගීතසද්දං සුත්වා යට්ඨිකොටිං විස්සජ්ජෙත්වා 'තිට්ඨථ තාව භන්තෙ, කිච්චං මෙ අත්ථී'ති තස්සා සන්තිකං අගමාසි. සො තත්ථ තාය සද්ධිං සීලවිපත්තිං පාපුණි. ථෙරො ඉදානි එකො ගීතසද්දො සූයිත්ථ. සො ච බො ඉත්ථියා සද්දො, සාමණෙරො'පි චිරායති. සො එකංසෙන සීලවිපත්තිං පත්තො භවිස්සතී'ති චින්තෙසි. සාමණෙරො'පි අත්තනො කිච්චං නිට්ඨාපෙත්වා ආගම්ම 'ගච්ඡාම භන්තෙ''ති ආහ. 'සාමණෙර, පාපො ජාතො'සී"ති ථෙරො පුච්ඡි. සො කිඤ්චි න කථෙසි.

අථ 'තාදිසෙන පාපකෙන සද්ධිං මම ගමනං නත්ථී"ති ථෙරො ආහ. සො ගිහී හුත්වා 'එථ, භන්තෙ, ගච්ඡාමා"ති ථෙරං ආහ. ථෙරො 'ආවුසො, ගිහී පාපො'පි පාපො; සමණපාපො'පි පාපො; තයා සද්ධිං මම ගමනං නත්ථී"ති වත්වා තං විස්සජ්ජෙසි. සො කන්දන්තො වනසණ්ඩං පාවිසි. අථ ථෙරස්ස සීලතෙජෙන සක්කස්ස පණ්ඩුකම්බලසිලාසනං උණ්හං අහොසි. සක්කො ලොකං ඔලොකෙන්තො දිබ්බෙන චක්ඛුනා ථෙරං අද්දස. අථ දෙවින්දො මග්ගිකවෙසං ගහෙත්වා ථෙරං උපසඞ්කමිත්වා ථෙරෙන සද්ධිං පටිසන්ථාරං කත්වා සාවත්ථිං ගන්තුං ථෙරං පක්කොසි.

(පාලි කථාමඤ්ජරී)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| සාමණෙරො | (ත) | - | සාමණේරයන් වහන්සේ |
| අරඤ්ඤෙ | (නා) | - | කැලයේ |
| දාරූනි | (නා) | - | දර |
| උද්ධරන්තියා | (කි) | - | උදුරන (කඩන) |
| එකිස්සා | (ස.නා) | - | එක් තැනැත්තියකගේ |
| ඉත්ථියා | (නා) | - | ස්ත්‍රියකගේ |
| ගීතසද්දං | (ස) | - | ගී හඬක් |
| යට්ඨිකොටිං | (ස) | - | සැරයටි කොණ |
| විස්සජ්ජෙත්වා | (පූ.ක්‍රි) | - | හැර දමා |
| තිට්ඨථ | (ක්‍රි) | - | සිටින්න |
| තාව | (නි) | - | එතෙක් කල් |
| කිච්චං | (කි) | - | කටයුත්තක් |
| මෙ | (ස.නා) | - | මට |
| අගමාසි | (ක්‍රි) | - | ගියේය |
| සද්ධිං | (නි) | - | සමග |
| සීලවිපත්තිං | (ස) | - | ශීල විපත්තියට |

| | | | |
|---|---|---|---|
| පාපුණි | (ක්‍රි) | - | පැමිණියේය |
| ඉදානි | (න) | - | දැන් |
| සූයිත්ථ | (ක්‍රි) | - | ඇසුණේය |
| එකංසෙන | (නි) | - | ඒකාන්තයෙන් |
| භවිස්සති | (ක්‍රි) | - | වන්නේය |
| චින්තෙසි | (ක්‍රි) | - | සිතුවේය |
| නිට්ඨාපෙත්වා | (පූ.ක්‍රි) | - | නිමවා |
| ආගම්ම | (පූ.ක්‍රි) | - | අවුත් |
| ජාතො | (කි) | - | උපන්නේ |
| පුච්ඡි | (ක්‍රි) | - | විචාළේය |
| කිඤ්චි | (නි) | - | කිසිවක් |
| කථෙසි | (ක්‍රි) | - | කීවේය |
| තාදිසෙන | (නි) | - | එබඳු |
| පාපකෙන | (ත) | - | පව්ටෙකු විසින් |
| සද්ධිං | (නි) | - | සමග |
| ගිහී | (නා) | - | ගිහියෙක් |
| හුත්වා | (පූ.ක්‍රි) | - | වී |
| එථ | (ක්‍රි) | - | එන්න |
| ආවුසො | (නි) | - | ඇවැත්නි |
| සමණපාපො | (ස) | - | ශ්‍රමණපාපියා |
| ගමනං | (කි) | - | ගමනක් |
| කන්දන්තො | (කි) | - | වැලපෙමින් |
| වනසණ්ඩං | (ස) | - | වනලැහැබට |
| පාවිසි | (ක්‍රි) | - | පිවිසියේය |
| සීලතෙජෙන | (ස) | - | ශීල තේජසින් |
| සක්කස්ස | (නා) | - | ශක්‍රයාගේ |
| සිලාසනං | (ස) | - | ශෛලාසනය |
| උණ්හං | (නා) | - | උණුසුම් |
| අහොසි | (ක්‍රි) | - | විය |
| ඔලොකෙන්තො | (කි) | - | බලන්නේ |
| දිබ්බෙන චක්ඛුනා | (නා) | - | දිවැසින් |
| අද්දස | (ක්‍රි) | - | දුටුවේය |
| දෙවින්දො | (ස) | - | ශක්‍රයා |
| මග්ගිකවෙසං | (ස) | - | මගියෙකුගේ වේශය |
| ගහෙත්වා | (පූ.ක්‍රි) | - | ගෙන |
| උපසඞ්කමිත්වා | (පූ.ක්‍රි) | - | එළඹ |
| පටිසන්ථාරං | (නා) | - | පිළිසඳර |
| කත්වා | (පූ.ක්‍රි) | - | කොට |
| ගන්තුං | (තු) | - | යන්නට |
| පක්කොසි | (ක්‍රි) | - | කැඳවීය |

අභ්‍යාස

1. 'ඉත්ථී සද්දො පුරිසස්සං චිත්තං ආකඩ්ඪති' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සාමණෙරො කාය සද්ධිං සීලවිපත්තිං පාපුණි?
ii. සාමණෙරො අත්තනො කිච්චං නිට්ඨාපෙත්වා ආගමම කිං ආහ?
iii. 'තාදිසෙන පාපකෙන සද්ධිං මම ගමනං නත්ථී"ති කො ආහ?
iv. කස්මා සක්කස්ස පණ්ඩුකම්බලසිලාසනං උණ්හං අහොසි?
v. දෙවින්දො කස්ස වෙසං ගණ්හි?

## තද්ධිත නාම

නාමයන් කෙරෙන් පර ව විවිධ අර්ථයන්හි නොයෙක් ප්‍රත්‍යයන් යෙදී සෑදෙන නාම සමූහය තද්ධිත නම් වේ.

උදා:- සමණ + ණෙර = සාමණෙර (සාමණේර තෙම)
ගුණ + වන්තු = ගුණවන්තු (ගුණ ඇති)
සබ්බ + දා = සබ්බදා (හැමකල්හි)

'මොහුට ශ්‍රද්ධාව ඇත' යනුවෙන් පද කීපයක් යොදා කිය යුතු අර්ථය එක් තද්ධිත පදයකින් ප්‍රකාශ කළ හැකි ය.

උදා:- 'අස්ස සද්ධා අත්ථී' (තද්ධිත රහිත)
'අයං සද්ධො' (තද්ධිත සහිත)

### තද්ධිත ප්‍රභේද

තද්ධිත නාම ප්‍රධාන වශයෙන් කොටස් තුනකට (03) බෙදේ. පහත දැක්වෙන්නේ තද්ධිත ප්‍රභේද හා ඒවායෙහි යෙදෙන ප්‍රත්‍යය කීපයකට උදාහරණයන් ය.

1. සාමඤ්ඤ තද්ධිත
2. භාව තද්ධිත
3. අව්‍යය තද්ධිත

## 1. සාමඤ්ඤ තද්ධිත

i. අපච්චත්ථ තද්ධිත
ii. අනෙකත්ථ තද්ධිත
iii. අත්ථ්‍යත්ථ තද්ධිත
iv. සඞ්ඛ්‍යා තද්ධිත

### i. අපච්චත්ථ තද්ධිත

යම් කෙනෙකුගේ දරුවෙක් යන අර්ථය පැවැසීමට නාමයන්ගෙන් පර ව '**ණ, ණායන**' ආදි ප්‍රත්‍යය යෙදේ.

| | | |
|---|---|---|
| වසිට්ඨ + ණ | = වාසිට්ඨ | (වසිට්ඨයගේ පුතා) |
| මොග්ගල්ල + ණායන | = මොග්ගල්ලායන | (මොග්ගල්ලගේ පුතා) |

### ii. අනෙකත්ථ තද්ධිත

නොයෙක් අර්ථයන්හි යෙදෙන තද්ධිත මෙයට අයත් වේ.

| | | |
|---|---|---|
| සකට + ණික | = සාකටික | (ගැලෙහි නියුක්ත වූයේ) |
| සඞ්ඝ + ණික | = සඞ්ඝික | (සංඝයාට අයත්) |
| මනුස්සජාති + ඉය | = මනුස්සජාතිය | (මිනිස් ජාතියෙහි වූ) |
| දයා + ආලු | = දයාලු | (කරුණා බහුලකොට ඇත්තේ) |
| සුවණ්ණ + මය | = සුවණ්ණමය | (රනින් කරන ලද) |

### iii. අත්ථ්‍යත්ථ තද්ධිත

යමෙකුට ධනය ආදි යමක් ඇත්නම් ඒ ඇති බව ප්‍රකාශ කිරීමට '**වන්තු, මන්තු**' යන ප්‍රත්‍යය යෙදේ.

| | | |
|---|---|---|
| ධන + වන්තු | = ධනවන්තු | (ධනය ඇති) |
| බුද්ධි + මන්තු | = බුද්ධිමන්තු | (නුවණ ඇති) |
| වාචා + ආල | = වාචාල | (වැඩි කථා ඇති) |

### iv. සඞ්ඛ්‍යා තද්ධිත

සඞ්ඛ්‍යා ශබ්ද කෙරෙන් පර ව විවිධ ප්‍රත්‍යය යෙදී සැදෙන පද සඞ්ඛ්‍යා තද්ධිත නම් වේ.

| | | |
|---|---|---|
| සත්ත + ම | = සත්තම | (සත්වෙනි) |
| ද්වි + ක | = ද්වික | (දෙකේ සමූහය) |
| චතු + ථ | = චතුත්ථ | (සතරවෙනි) |


*නොමිලේ බෙදා හැරීම පිණිසයි*

## 2. භාව තද්ධිත

යම් ශබ්දයක පැවැත්මට හේතු වූ ගුණක්‍රියාදි ලක්‍ෂණ ‘භාව’ නම් වේ. ඒ ලක්‍ෂණ පවසත් හොත් ශබ්ද කෙරෙන් පර ව ‘**ත්ත, තා**’ ආදි ප්‍රත්‍යය වේ.

ලහු + තා = ලහුතා (සැහැල්ලු බව)
මනුස්ස + ත්ත = මනුස්සත්ත (මිනිසත් බව)
අරොග + ණ්‍ය = ආරොග්‍ය (නීරෝගී බව)
පණ්ඩිත + ණ්‍ය = පණ්ඩිච්ච (පණ්ඩිත බව)

## 3. අව්‍යය තද්ධිත

මේ ගණයට අව්‍යය ලක්‍ෂණ ඇති තද්ධිත පද අයත් වේ. මේවා විභක්තිවල නො වරනැගේ.

සබ්බ + ත්ථ = සබ්බත්ථ (සැමතැන)
සබ්බ + දා = සබ්බදා (හැමකල්හි)
බහු + ධා = බහුධා (බොහෝ ආකාරයෙන්)
අජ්ජ + තන = අජ්ජතන (අද, අද වූ)
ඉම + දානි = ඉදානි (දැන්)

| ප්‍රත්‍යය | නාමය හා ප්‍රත්‍යය | තද්ධිතය | අර්ථ |
|---|---|---|---|
| අව | මනු + අව | = මාණව | මනුගේ පුත්‍රයා |
| ආයන | කච්ච + ආයන | = කච්චායන | කච්චගේ පුතා |
| ඉක | අභිධම්ම + ඉක | = ආභිධම්මික | අභිධර්මය දන්නා |
| ඉක | සක්‍යපුත්ත + ඉක | = සක්‍යපුත්තික | සක්‍යපුත්තගේ පුත්‍රයා |
| ඉට්ඨ | පාප + ඉට්ඨ | = පාපිට්ඨ | පවිටු |
| ඉය | පාප + ඉය | = පාපීය | පවිටු |
| ක්ඛත්තුං | එක + ක්ඛත්තුං | = එකක්ඛත්තුං | එක්වරක් |
| තම | පාප + තම | = පාපතම | අතිශයින් ම පවිටු |
| තා | ජන + තා | = ජනතා | ජන සමූහය |
| තා | මුදු + තා | = මුදුතා | මෘදු බව |
| ධා | දස + ධා | = දසධා | දසවැදෑරම් |
| මන්තු | සති + මන්තු | = සතිමන්තු | සිහි ඇති |
| වන්තු | ගුණ + වන්තු | = ගුණවන්තු | ගුණ ඇති |

### තද්ධිත භාවිතය හා ප්‍රයෝජනය

තද්ධිත නාම සියලු විභක්තිවල හා ලිඞ්ගත්‍රයෙහි නාමපද මෙන් වරනැගේ. එහෙයින් තද්ධිතවලින් භාෂාවට විශේෂ ප්‍රයෝජන ලැබේ. මටසිලුටු බව හා සරල බව ද ඇති වේ. සමාසවලට වඩා පදයන්ගේ අතිශය කෙටිවීමක් තද්ධිත පදයන්ගෙන් ලැබේ.

**අභ්‍යාස**

1. පහත සඳහන් අර්ථ ප්‍රකට වන තද්ධිත පදය දී ඇති නාමයෙන් සකස් කරන්න.

| | | |
|---|---|---|
| i. | රනින් කළ | (සුවණ්ණ) |
| ii. | වච්ඡගේ පුතා | (වච්ඡ) |
| iii. | පයින් යන්නා | (පද) |
| iv. | නැවෙහි යෙදුණු | (නාවා) |
| v. | මගධයේ උපන් | (මගධ) |
| vi. | නුවණැති | (මෙධා) |
| vii. | ගුණැති | (ගුණ) |
| viii. | මෘදු බව | (මුදු) |
| ix. | නවවෙනි | (නව) |
| x. | මහත්බව | (විපුල) |

2. පහත දැක්වෙන තද්ධිත පදයන්හි ප්‍රභේද නම් කරන්න.

i. මාණවො
ii. කච්චායනො
iii. පාපිට්ඨො
iv. ගුණවා
v. දසධා
vi. පාපතමො
vii. ආභිධම්මිකො
viii. ජනතා
ix එකක්ඛත්තුං
x. සතිමා

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. කනිට්ඨො රාජපුත්තො සිප්පං උග්ගණ්හාති.
ii. අයං මාණවො කනකවිමානෙ නිබ්බත්තිස්සති.
iii. ධම්මිකො රාජා කායිකමානසිකං සුඛං වින්දති.
iv. දයාලු භගවා මහාජනතං සන්දිට්ඨිකං ධම්මං දෙසෙසි.
v. තයො තස්ස පාසාදා හොන්ති. එකො හෙමන්තිකො එකො ගිම්හිකො එකො වස්සිකො

4. සුදුසු තන්හි තද්ධිත පද භාවිත කරමින් පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සාමණේරයන් වහන්සේ සැමකල්හි සිල් රකිති.
ii. දයාව ඇති පුරුෂයා යාචකයාට බොහෝ අයුරින් දන් දෙයි.
iii. කාන්තාව රනින් කරන ලද ආභරණ මිල දී ගනියි.
iv. අද මෙහි ඔහුගේ පණ්ඩිත බව ප්‍රකට විය.
v. ගැල්කරුවා නගරයේ සැමතැන ම ගැල ගෙන යයි.

5. නාම හා ප්‍රත්‍යය ගළපා අර්ථවත් තද්ධිත පද සාදන්න.

| | | |
|---|---|---|
| i. | කච්ච | තර |
| ii. | දිවා | ඉක |
| iii. | සඞ්ඝ | වී |
| iv. | පඤ්ඤා | ධා |
| v. | මායා | සො |
| vi. | ති | තා |
| vii. | සබ්බ | ආන |
| viii. | ලහු | වන්තු |
| ix. | අනන්ත | ණ්‍ය |
| x. | අරොග | ඉම |

6. පහත දැක්වෙන තද්ධිත පදයන්හි අර්ථ ලියන්න.

i. පුරාතනං
ii. අට්ඨමං
iii. එත්ථ
iv. මෙධාවිනී
v. කදා
vi. භාගිණෙය්‍ය
vii. පාටවං
viii. දාරුමයං
ix. බාහුසච්චං
x. පුත්තකො